
කුකුළා හා පාට



වි. සුතේයෙව්

වි. සුතේයෙව්



අනුවාදය
පද්ම හර්ෂ කුරණාගේ

Kanol

කුකුළා හා පාට

කතාව සහ චිත්‍ර
වී. සුතේයෙව්

අනුවාදය
පද්ම හර්ෂ කුරණගේ

නව සකැසුම
මාලක ලලනජීව

ISBN 978-955-1979-18-8

ප්‍රකාශනය
කැනොල් පබ්ලිෂිං හවුස්

මුද්‍රණය
රොනැට් එන්ටප්‍රයිසස්


ප්‍රථම මුද්‍රණය 2011



චෝවා කුකුළෙකුගේ රූපයක් ඇන්දා. නමුත් ඔහුට එය පාට කිරීමට අමතක වුණා.

දවසක් කුකුළා ගමනක් ගියා. එවිට කුකුළාට බල්ලෙක් හමු වුණා. "බලන්න උඹේ හැටි! පාට කර නැහැ නොවැ!" යි බල්ලා කිව්වා.

කුකුළා පොකුණක් ළඟට ගියා. එහි තම ඡායාව දෙස එබී බැලුවා. "බල්ලා කිව් දේ සැබෑ තමයි" කුකුළා තමාටම කියා ගත්තා.







"කනගාටු වෙන්න එපා! සායම්වලින් ඔබට උදව් ලබා ගන්න පුළුවනි. ඒවා සොයා යන්නැ" යි බල්ලා කුකුළාට උපදෙස් දුන්නා.



කුකුළා සායම් සොයා ගොස් "කරුණාකර මා පාට කරන්නැ" යි ඉල්ලා සිටියා.



රතු පාට ඊට කැමති වී කුකුළාගේ උඩු කරමලත් යටි කරමලත් හොඳටම රතු වන තුරු පාට කළා.




නිල් පාට ද වලිගයේ පිහාටු සියල්ල ම නිල් පාට කළා.




කොළ පාට, අත්තටු සායම් කළා.




කහපාට, බෙල්ල හා පපුව සායම් කළා.




"ආ! උඹ දැන් නම් නියම කුකුළෙක්" ඊට පසු බල්ලා කිව්වා.





මේ කුකුළා පාට කරන්න. කුකුළු පැටියා කහපාට කරන්නට මතක තබා ගන්න.























Kanol Publishing House
1196/4, Kottawa Road, Pannipitiya
Tel: 011 4336778, 011 4336779

ISBN 978-955-1979-18-8
Rs. 80/-